**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 3 ව්‍යාපෘතිය -2018**

-----------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 3 ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2016 අගෝස්තු 11 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ 2.10 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348 දරන ණය ගිවිසුමේ iv පරිච්ඡේදයේ 4.05 වගන්තිය හා අංක 3349-ශ්‍රී (එස්එෆ්) දරන ණය ගිවිසුමේ iv පරිච්ඡේදයේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(l) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂන මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 3 ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වනුයේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 123 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා හා රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 05 ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 7,742.80 කට සමාන එජඩො. මිලියන 59.56 ක් යුරෝපීය ආයෝජන බැංකුව මගින් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,259.8 කට සමාන එජඩො මිලියන 40.46 ක් ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහන් මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන එහි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ණය ලබා දෙන ආයතනය විසින් අයකර ගත් එකතුව රු. මිලියන 81.17 කට සමාන එජඩො 501,992 ක් වූ බැදීම් ගාස්තු සහ පොලීය, කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාවට නංවන ලද මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - II කොටසෙන් වෙන් කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | 81.17 | පොලී සහ බැදීම් ගාස්තු අඩුවෙන් දැක්වීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය අංශයෙන් ලැබුණු උපදෙස් අනුව පොලී සහ බැදීම් ගාස්තු ව්‍යාපෘති කළමණාකරණ ඒකකයේ පොත්වල ගිණුම් තැබීම සිදු නොකරයි. එබැවින්, අදාළ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සඳහා වන සටහන් තුල පොලී සහ බැදීම් ගාස්තු අනාවරණය කර ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයේ දී උපයෝජනය කරන ලද ණය වටිනාකම නිරූපනය කිරිම සඳහා අදාළ පිරිවැය වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මහා කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති 01 හා ව්‍යාපෘති අංක 02 හි පුනරුත්ථාපන හා පුළුල්කිරීමේ වැඩ කාර්යයන් සඳහා වූ මූල්‍ය පරතරය පියවීමට අතිරේක මූල්‍යකරන සැලසුම් කිරීම් හරහා අමතර අරමුදල් වෙන්කිරීමක් සඳහා වූ ඉල්ලීමක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් 2016 වර්ෂයේදී සිදුකර තිබුණි. එහෙත් ඒ වන විට අදාල වැඩසටහන් වල වූ ක්‍රියාකාරකම්හි පිළිවෙලින් සියයට 36.25 ක් හා 8.41ක් වැනි මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත් ඉහත ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කල ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දින වන විටද ඉලක්ක ගත මට්ටමට ළඟාවී නොතිබුන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අතිරේක මූල්‍යකරන සැලසුම්කිරීම් යටතේ වෙන්කල රු.මි.4500 කට සමාන ඇ.එ.ජ.ඩො.මිලියන 35 ක මුදල අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | වෙන් කරන ලද ණය , ඌණ උපයෝජනය වීම හා ඒ සඳහා බැඳීම් ගාස්තු දැරීමට සිදු වීම | අදහස් දක්වා නොමැත. | විදේශ අරමුදලේ සැබෑ අවශ්‍යතාවය තීරණය කිරීම හා ඒ මත බෙදා හැරීමේ සැලැස්ම සකස් කල යුතු වීම. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| වැඩ සටහනෙහි අරමුණු කාලිනව සාක්ෂාත් කර ගැනීමට වැඩ සටහන විසින් විස්තීර්න ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණු බවට නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීම | ජාතික ජල සම්පාදන මණ්ඩලය තුල ඇති අභ්‍යන්තර හැකියාවක් හා පහසුකම් සහ කාලය සැලකිල්ලට | ආයතන තුල ඇති සම්පත් භාවිතය පිළිබඳව ප්‍රමුඛතා පදනමින් සලකා බැලීම් අවශ්‍ය වේ. |

තුලදී වැඩසටහන විසින් පිළිවෙලින් පිරිවැය රු.මිලියන 64.45 කට සමාන ඇ.එ.ජ.ඩො. 405,794 ක් හා රු.මිලියන 17.36 කට සමාන ඇ.එ.ජ.ඩො. 112,867 ක් වටිනා උපදේශණ සේවා කොන්ත්‍රාත්තු 04 ක් හා වැඩ කොන්ත්‍රාත්තු 13 ක් ප්‍රදානය කර තිබුණි. තවද, රටතුල නලමාර්ගික පානීය ජල සැපයුම් ආශ්‍රිත සේවාවන් සපයනු ලබන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශේෂිත දැනුම හා අත්දැකීම් පිළිබඳව සලකාබැලීමකින් තොරව අනාගත උප ව්‍යාපෘති හඳුනා ගැනීම සහ සූදානම් කිරීමේ වැඩ සඳහා ජල පීඩනය පදනම් කරගෙන නල මාර්ග සැලසුම් කිරීමේ මොඩලය, ප්‍රජාව විසින් පාරිභෝජනය කරනු ලබන හා නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මුළු පිරිපහදු ජල පරිමා අධ්‍යනය, පාරිභෝගික ආරක්ෂාව හා සමාජ ආරක්ෂාව යන කටයුතු සඳහා වූ උපදේශණ සේවා කොන්ත්‍රාත්තුවන් පෞද්ගලික ආයතනයන් වෙත ප්‍රදානය කර තිබුණු බවට නිරීක්ෂණය විය.

ගනිමින් උපදේශන සේවා බාහිරින් ලබා ගැනීමට තීරණය කරන ලදී.